ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**දිනය** : 2018.03.06

## සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීම සම්බන්ධව 2018.03.05 දින නිකුත් කරන ලද පුවත්පත් නිවේදනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී ආයතනය වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීම සම්බන්ධයෙන් 2018.03.05 දින නිකුත් කරන ලද පුවත්පත් නිවේදනය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් පැහැදිලි කරයි. 2017.12.05 වන දින පුවත්පත් නිවේදනයක් මගින් මහජනතාව වෙත දැනුම්දුන් පරිදි සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී ආයතනයෙහි සියළුම රක්ෂිත තැන්පතුවලට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි රෙගුලාසි අනුව තැන්පත්කරුවෙකු සඳහා රුපියල් 600,000/- උපරිමයක් දක්වා ගෙවීම් සිදුකරනු ඇත.